# පුරවැසි අධ්‍යාපනය

6

ශ්‍රේණිය

පළමු වාරය

## අපේ පාසල




සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පුරවැසි අධ්‍යාපනය පළමු වාරය - අපේ පාසල (සි) - 6 ශ්‍රේණිය
குடியியற் கல்வி - முதலாம் தவணை - எமது பாடசாலை (சி) - தரம் 6
SC06EC1S-2026/318/247,900

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ - තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මඟින් නැරඹිය හැකිය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e- Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

The National e-learning Portal for The General Education

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

නැණස TV நெனச TV

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
ChannelNIE
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books

අපේ රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය ලබන වසරේදීත් ඔබ සහෝදර සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න

පාසලේ නම : ..............................................................................................

| | පොත ලබා ගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පන්ති භාර ගුරුතුමාගේ / ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# පුරවැසි අධ්‍යාපනය

පළමු වාරය

## අපේ පාසල

## 6 ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව



**සියලු ම මොඩියුල ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට www.nie.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න**

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පුරවැසි අධ්‍යාපනය - 6 ශ්‍රේණිය
පළමු වාරය
මොඩියුල අංක 1
අපේ පාසල

ප්‍රථම මුද්‍රණය : 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි
ISBN 978-624-5729-36-4

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
කුරුණෑගල, කොළඹ පාර, අංක 343 දරන ස්ථානයෙහි පිහිටි
චම්පිකා ප්‍රින්ටර්ස් ආයතනයෙහි
මුද්‍රණය කරවන ලදි.

Published by : National Institute of Education
Printed by : Champika Printers, No. 343, Colombo Road, Kurunegala.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ ඉගෙනුම් පාදක මොඩියුල ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් ආධාරක, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් ආධාරක ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2025.07.21

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අත්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.08

## උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශනය**

| | |
|---|---|
| මහාචාර්ය මංජුලා විතානපතිරණ | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආචාර්ය දර්ශන සමරවීර | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**අධීක්ෂණය**

| | |
|---|---|
| ඩී. එච්. සී. එන්. ධර්මපාල | අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| එස්. යූ. අයි. කේ. ද සිල්වා | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, විෂය ව්‍යාපෘති ප්‍රධානි<br>(පුරවැසි අධ්‍යාපනය), ජාතික අධ්‍යාපන ආයතනය. |

**රචනය**

| | |
|---|---|
| එස්. යූ. අයි. කේ. ද සිල්වා | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, විෂය ව්‍යාපෘති ප්‍රධානි<br>(පුරවැසි අධ්‍යාපනය), ජාතික අධ්‍යාපන ආයතනය. |
| පී. ටී මාරසිංහ | නියෝජ්‍ය විදුහල්පති, ජනාධිපති විද්‍යාලය, කෝට්ටේ. |
| ටී. ඩී. එන්. අයි. තිලකරත්න | ගුරු සේවය,<br>බ/ දඹවින්න ශ්‍රී සරණංකර මහා විද්‍යාලය, වැලිමඩ. |
| බී. ප්‍රේම්ලන් | ගුරු සේවය,<br>කල්/කල්/ වෙස්ලි උසස් පාසල, කල්මුනේ. |

**සංස්කරණය**

**අභ්‍යන්තර**

| | |
|---|---|
| එස්. යූ. අයි.කේ. ද සිල්වා | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, විෂය ව්‍යාපෘති ප්‍රධානි,<br>(පුරවැසි අධ්‍යාපනය), ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආචාර්ය කේ. ජී. කේ. ප්‍රභාෂ් | සහකාර කථිකාචාර්ය,සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**බාහිර**

| | |
|---|---|
| එල්. එම්. වංශවතී | පීඨාධිපති (විශ්‍රාමික),<br>වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, බිංගිරිය. |
| ආචාර්ය කේ. ඒ. එන්. පුෂ්පකුමාර | කථිකාචාර්ය,<br>ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, පතන. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| පී. ඩී. එච්. ඊ. පනාගොඩ | ගුරු විදුහල්පති, රජයේ ගුරු විදුහල, බළපිටිය. |

**පිටකවර චිත්‍ර හා පිටු සැකසුම් නිර්මාණය**

| | |
|---|---|
| කසුන් පුෂ්පික තලගල | ගුරු සේවය,<br>බප/ජය/ ශ්‍රී සෝමානන්ද මහා විද්‍යාලය,<br>කොරතොට. |

## හැඳින්වීම

'අපේ පාසල' යන පළමු තේමාව යටතේ සංවර්ධනය කර ඇති විෂය අන්තර්ගතය ඇතුළත් ඔබ අතට පත්වන පළමු මොඩියුලය මෙයයි. මෙම මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම්වලට අදාළ ව දී ඇති උපදෙස් හොඳින් කියවා තේරුම් ගෙන, තවදුරටත් ගුරුතුමා/ ගුරුතුමියගේ මග පෙන්වීම් අනුව එහි ක්‍රියාශීලී ව නිරතවීම ඔබගේ යුතුකමක් (Duties) මෙන් ම වගකීමක් (Responsibilities) ද වේ. සාමූහික ව සහ තනි තනි ව පන්ති කාමරයේ දී මෙන් ම ඉන් බැහැරවත්, විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ වෙමින් සතුටින් හා කාර්යක්ෂම ව නිරතවීමට ඔබට අවස්ථාව ලැබෙන පරිදි මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් සැලසුම් කර තිබේ. අප අවට පරිසරය තුළ පෙනෙන, ඇසෙන සහ දකින දෑ සවිඥානික ව ග්‍රහණය කර ගැනීමට හැකිවන පරිදි ගවේෂණය (Exploration), නිරීක්ෂණය (Observation), සිද්ධි පාදක අධ්‍යයනය (Case Studies), සම්පත් පුද්ගල සහය (Resource Person) සහ සැසඳීම (Comparison) වැනි විවිධ ශිල්ප ක්‍රම භාවිතයට අවස්ථා සම්පාදනය කර ඇත.

මෙම මොඩියුලයේ ඇති ක්‍රියාකාරකම්වල නිරතවීමේ දී ඔබව දෙයාකාරයකට තක්සේරු කරනු ලැබේ. එනම්, ක්‍රියාකාරකම සිදු කරන අතරතුර හා මොඩියුලය අවසානයේ ඇගයීම වශයෙනි. ඒ ඇසුරින් වාරය අවසානයේ මොඩියුලයට අදාළ ව ඔබගේ සාධන මට්ටම තීරණය වේ. පුරවැසි අධ්‍යාපනය විෂය ව්‍යාපෘති කණ්ඩායමේ මූලික අපේක්ෂාව වනුයේ, 21වන සියවසේ කුසලතා (21st Century skills) සපිරි, පූර්ණ පෞරුෂයක් සහිත අනාගත අභියෝග ජයගත හැකි සබුද්ධික පුරවැසියකු බිහිකිරීමට අවැසි මූලික ගුණාංග සහ කුසලතා සංවර්ධනය කර ගැනීමට අවස්ථා සම්පාදනය යි. ඔබේ ම සහෝදර සහෝදරියන්ට ඉදිරි වසරවලදී ද ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි මෙම මොඩියුලය සුරක්ෂිත ව පරිහරණය කිරීම ඔබගෙන් අපේක්ෂා කරමි.

**ඩී. එච්. සී. එන්. ධර්මපාල**
අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,


මොඩියුලය 01 - පුරවැසි අධ්‍යාපනය
ශ්‍රේණිය : 6
වාරය : 01
තේමාව : අපේ පාසල
'සිප්කිරි පොවනා සිප්හල සොයමු බලමු දැනගමු'
කාලය : කාලච්ඡේද 12යි

# පටුන

ක්‍රියාකාරකම 01
පාසල (School) හඳුනාගනිමු 03

ක්‍රියාකාරකම 02
පාසල් සංස්කෘතියට (School Culture) අනුගත වෙමු 08

ක්‍රියාකාරකම 03
පාසලේ සංවිධාන ව්‍යුහය (Organizational structure of the school) හඳුනාගනිමු 16

ක්‍රියාකාරකම 04
ප්‍රජාව (Community) සමග එක් වී පාසල ගොඩනගමු 22

ක්‍රියාකාරකම 05
අනාගත පාසලේ ස්වභාවය මනසින් ගොඩනගමු (Imagination) 26

ක්‍රියාකාරකම 06
මම මගේ ස්වභාවය හඳුනාගනිමි (Identify the Nature of myself) 31



# අපේ පාසල

**මෙම ක්‍රියාකාරකම් මොඩියුලය අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ**

- තම පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු ඇසුරින් පාසල් පැතිකඩ නිර්මාණය කිරීම.
- තම පාසලේ සුවිශේෂී ගුණාංගවලට අනුගත ව ශිෂ්‍ය භූමිකාව නිරූපණය කිරීම.
- තම පාසල හා අන්‍ය පාසල්වල සංස්කෘතික විවිධත්වයට ගරු කිරීමේ වැදගත්කම අගය කිරීම.
- පාසලේ සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන භූමිකා සතු වගකීම් සහ යුතුකම්වල වැදගත්කම අගය කිරීම.
- පාසලේ අභිවෘද්ධියට උපකාරී වන අභ්‍යන්තර හා බාහිර ප්‍රජාව දායකත්වය ලබා දෙන ක්‍රියාකාරකම්වලට සහය වීම.
- අනාගත පාසලේ ස්වභාවය මනසින් ගොඩනැගීම.
- තමා පිළිබඳ ව මතුකර ගත් අනාවරණ ඇසුරින් තම අනාගත ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාත්මක වීම.

## පෙර පිරික්සුම

මෙම වැකිවලට ඔබ එකඟ නම් ☑ ලකුණ ද එකඟ නොවේ නම් ☒ ලකුණ ද යොදන්න.

- මා වඩාත් ප්‍රිය කරන ස්ථානවලින් එකක් වන්නේ පාසලයි. ☐
- පාසල අපට යහපත් පුරවැසියකු වීමට මගපෙන්වයි. ☐
- පාසලේ පොදු දේපළ ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකමකි. ☐
- පාසල තුළ සිටින විවිධ තනතුරු දරන පුද්ගලයෝ අපට විවිධාකාර ලෙස සහය දක්වති. ☐

ඔබ ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ පාසලේ නම ලියන්න.

------------------------------------------------------------

අනාගත සමාජයට පිවිසෙන දරු දැරියන් යහපත් පුරවැසියන් ලෙස විධිමත් ව හැඩ ගැස්වීමට හැකියාව ඇති ප්‍රශස්ත ආයතනවලින් එකක් ලෙස පාසල හැඳින්විය හැකි ය. 21වන සියවස හා ඉන් ඔබ්බට අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීමෙන් ගෝලීය පුරවැසියකු (Global Citizen) ලෙස සමාජගත වීමේ අවස්ථා සම්පාදනය පාසලෙන් ඉටුවන ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි.















ඡායාරූප උපුටා ගැනීම
ජනාධිපති විද්‍යාලය, කෝට්ටේ.
බප/ජය/ ශ්‍රී සෝමානන්ද මහා විද්‍යාලය, කොරතොට.
ශ්‍රී ගනේෂා දෙමළ මහා විද්‍යාලය, බුලත්කොහුපිටිය.
මාවනැල්ල සහිරා ජාතික පාසල, මාවනැල්ල.

# ක්‍රියාකාරකම 01 - පාසල හඳුනාගනිමු.

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා හට**

- විධිමත් සංවිධානයක් ලෙස පාසලේ සුවිශේෂත්වය පැහැදිලි කිරීමට,
- විවිධ ලේඛන ඇසුරින් පාසල පිළිබඳ මූලික තොරතුරු රැස් කිරීමට,
- පාසලේ පසුබිම් තොරතුරු ගවේෂණය කිරීමට,

හැකියාව ලැබෙනු ඇත.

**කාලය : කාලච්ඡේද 02යි.**

## පියවර 1

**පෙර සූදානම**

පන්ති කාමර ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් අනුව කණ්ඩායම්වලට බෙදී පාසලේ නිරීක්ෂණ චාරිකාවක යෙදෙන්න. පාසල් පැතිකඩ නිර්මාණය කිරීමට අවශ්‍ය වන පාසල පිළිබඳ මූලික තොරතුරු හා පසුබිම් තොරතුරු, පාසලේ කාර්යභාරය හා ඉන් ඉටු වන සේවය ආදිය සටහන් කර ගන්න.



## පියවර 2

- පාසලේ නිරීක්ෂණ චාරිකාවේ යෙදුණ කණ්ඩායම් එක්රැස් වී පහත මාතෘකා ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - පාසලෙන් සිදු වන කාර්යභාරය
    - පාසලෙන් අපට ලැබෙන දේ
    - පාසලේ ඇති සුවිශේෂත්වය
    - පාසල යනු කුමක් ද ?
- සාකච්ඡාව අවසානයේ 'විධිමත් සංවිධානයක් ලෙස පාසල' (School as a formal Organization) මැයෙන් කණ්ඩායම් අනාවරණයක් ගොඩනගන්න.
- කණ්ඩායම් නායකයින් විසින් තම කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්න.

## පියවර 3

ඔබ පාසලේ මූලික හා පසුබිම් තොරතුරු පිළිබඳ ව රැස් කර ගත් තොරතුරු ඇසුරින් පහත ආකෘතිය සම්පූර්ණ කරන්න.

### පාසල පිළිබඳ මූලික තොරතුරු

- පාසලේ නම හා ලිපිනය:-.............................................................
- දුරකථන අංකය:-............ ■ විද්‍යුත් ලිපිනය (email):-........................
- පාසලේ අනන්‍යතා අංකය:-...... ■ පාසල් සංගණන අංකය:-......
- පාසල් වර්ගය:-....■ අධ්‍යාපන කොට්ඨාසය:-....■ අධ්‍යාපන කලාපය:-....
- ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය:-...................................
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-..............................................
- දිස්ත්‍රික්කය:-...................................... ■ පළාත:-.................................

### පාසල පිළිබඳ පසුබිම් තොරතුරු

- ආරම්භක වර්ෂය:- ................. ■ පාසලේ නිර්මාතෘවරු:- ....................
- සුවිශේෂ සන්ධිස්ථාන:- ..................................................................

# SCHOOL PROFILE

## කියවමු

පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු ඇතුළත් කරමින් පාසලේ ස්වභාවය හඳුනාගැනීම සඳහා ගොඩනගා ඇති විද්‍යුත්/ ලිඛිත මූලාශ්‍රය පාසල් පැතිකඩ (School Profile) වේ. පාසල් පැතිකඩ සකස් කිරීමේ දී පහත සඳහන් තොරතුරු ඊට ඇතුළත් කිරීම එහි ගුණාත්මකභාවය වැඩිදියුණු වීමට හේතු වේ.


උදාහරණ

1. පාසලේ දැක්ම හා මෙහෙවර (Vision and Mission)
2. පාසල් නිල ලාංඡනය (Emblem)
3. පාසල් ධජය (Flag)
4. පාසල් ගීතය (Anthem)
5. පාසලේ තේමා පාඨය (Theme)
6. පාසල් නිල ඇඳුම (Uniform)
7. පාසල් දින දර්ශනය (Calendar)
8. පාසල් සිතියම (Map)
9. පාසලේ නිල ධුරාවලිය (Hierarchy)
10. පාසලට සුවිශේෂ නීතිරීති (Rules and Regulations)

## තක්සේරු ක්‍රියාකාරකම

- ඔබ කණ්ඩායම විසින් ඉහතින් රැස් කළ තම පාසල පිළිබඳ මූලික හා පසුබිම් තොරතුරු ඇසුරෙන් පාසල් පැතිකඩ නිර්මාණය කරන්න.
- ඒ සඳහා පහත නිර්ණායක ඔස්සේ ලකුණු පිරිනැමෙනු ඇත.
    - විධිමත් සංවිධානයක ලක්ෂණ පාසල තුළ පිළිබිඹු වන ආකාරය අන්තර්ගත ව තිබීම.
    - පාසලෙන් ඉටුවන ප්‍රමුඛ කාර්යයන් පැහැදිලි ව දැක්වීම.
    - නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම.
    - දත්ත හා තොරතුරුවල ගුණාත්මක හා ප්‍රමාණාත්මකබව.
    - සාමූහික ව කටයුතු කිරීම.

## ස්වයං තක්සේරුව

| මා තහවුරු කර ගත් අත්දැකීම් |  |  |  |
|---|---|---|---|
| විධිමත් සංවිධානයක් (Formal Organization) ලෙස පාසල | | | |
| විධිමත් සංවිධානයක් ලෙස පාසලේ සුවිශේෂත්වය | | | |
| පාසල් පැතිකඩ නිර්මාණය කිරීමේ වැදගත්කම | | | |
| විධිමත් පාසල් පැතිකඩක් නිර්මාණය කිරීමේ කුසලතාව මා සතුව පවතින බව | | | |
| ලොග් පොත, සමරු ඵලක, පාසලේ ආදි කතෘවරුන්ගේ ප්‍රකාශ, පාසල පිළිබඳ ලියවී ඇති විවිධ පොත්පත් සහ වෙනත් ලේඛන පරිශීලනයෙන් පාසල පිළිබඳ මූලික තොරතුරු රැස් කිරීමේ වැදගත්කම | | | |
| පාසලේ ආරම්භක වර්ෂය, පාසලේ නිර්මාතෘවරු සහ සුවිශේෂ සන්ධිස්ථාන ඇසුරින් පාසල පිළිබඳ පසුබිම් තොරතුරු ගවේෂණය කිරීමේ වැදගත්කම | | | |

 හොඳින් හඳුනාගතිමි.  තරමක් දුරට හඳුනාගතිමි.

 අවබෝධ කර ගැනීමට තවදුරටත් සහය අවශ්‍යයි.



# සාරාංශය

- පාසල් සමාජයේ දීර්සකාලීන සාමාජිකයකු ලෙස, ජීවිතයට ඉතා වැදගත් අත්දැකීම් සම්භාරයක් ලබා ගැනීමේ අවස්ථාව අපට හිමි ව ඇත.
- පාසලේ මූලික හා පසුබිම් තොරතුරු පිළිබඳ ව දැනුවත්වීම පාසල වඩාත් නිවැරදි ව හඳුනාගැනීමට උපකාර වේ.
- පාසල් සමාජයේ සාමාජිකයන් ලෙස පාසලේ මූලික හා පසුබිම් තොරතුරු විවිධ ක්‍රමෝපායන් ඇසුරෙන් ගවේෂණය කළ හැකි ය.
- පාසල තුළ විධිමත් සංවිධානයක ලක්ෂණ පිළිබිඹු වේ.

  උදාහරණ
  - පැහැදිලි ව සකසන ලද සංවිධාන ව්‍යුහයක් පැවතීම
  - සියලු ම සාමාජිකයන්ට කාර්යයන් පවරා තිබීම
  - පාසලේ කටයුතු ක්‍රමානුකූල ව සිදු කිරීම
  - පැහැදිලි නීතිරීති පැවතීම
  - පාසලේ පැවැත්ම දිගුකාලීන වීම
  - පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් සියලු දෙනා කැපවීම
- පුද්ගලයා, සමාජයට අවශ්‍ය පරිදි හැඩගස්වා යොමු කිරීමටත්, සමාජ පැවැත්ම තහවුරු කිරීමටත් පාසල විශිෂ්ට දායකත්වයක් ලබා දෙයි.
- "පාසල් පැතිකඩ" පාසලේ සමස්තය පිළිබඳ නිරූපණයකි.



# ක්‍රියාකාරකම 02 - පාසල් සංස්කෘතියට අනුගත වෙමු.

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා හට

- නිල ඇඳුම හා එහි ප්‍රමිතීන් පාසලේ අනන්‍යතාව හඳුනාගැනීම සඳහා උපයෝගී වන ආකාරය පැහැදිලි කිරීමට,
- පාසලේ අනන්‍යතාව හඳුනාගැනීමට නිල ලාංඡනය උපයෝගී වන ආකාරය අවබෝධ කර ගැනීමට,
- පාසලේ අනන්‍යතාව නිරූපණය කිරීමට පාසල් කොඩිය දායක වන ආකාරය විස්තර කිරීමට,
- පාසල් ගීතයෙන් දැක්වෙන අර්ථය ඉටු කිරීමට තම දායකත්වය ලබා දිය යුතු ආකාරය උදාහරණ ඇසුරෙන් ඉදිරිපත් කිරීමට,
- පාසලේ ආදර්ශ පාඨයේ අර්ථය සපුරා ගැනීමට,
- පාසලේ සංස්කෘතියට අයත් මූලික අංග හඳුනාගැනීමට,
- පාසලේ පවතින පොදු නීති අනුගමනය කිරීමේ ශිෂ්‍ය වගකීම ඉටු කිරීමට,
- පාසලට සුවිශේෂ වූ ගුණාංග අනුගමනය කිරීමට,
- තම ආසන්න පාසල්වල සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීමට,

හැකියාව ලැබෙනු ඇත.

කාලය : කාලච්ඡේද 03 යි.

## පියවර 1

### පාසලේ අනන්‍යතාව තහවුරු කරන සාධක හා සබැඳි ශිෂ්‍ය භූමිකාව



**කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් අනුව සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල පහසුවෙන් යෙදිය හැකි, ඔබට ආසන්න හෝ පහසුවෙන් තොරතුරු සොයා ගත හැකි පාසලක් ගුරුතුමා/ගුරුතුමියගේ මගපෙන්වීම අනුව තෝරාගන්න.
- ගුරුතුමා/ගුරුතුමිය විසින් ලබා දෙන කාර්ය පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න. (ඇතැම් පාසල්වල තොරතුරු අන්තර්ජාලය තුළින් ලබා ගත හැකි අවස්ථා පවතින බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන්න.)
- ඔබේ පාසලෙත්, ඔබ තෝරා ගත් පාසලෙත් අනන්‍යතා ලක්ෂණ විදහාපාන සංකේත හා ඒවායෙන් නිරූපණය වන විස්තර කණ්ඩායමට ලබා දී ඇති කාර්ය පත්‍රිකාවට අනුව ගොනු කරන්න.
- කණ්ඩායම් විසින් රැස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.



පහත සඳහන් ආකෘතියේ ඇතුළත් ශීර්ෂ යටතේ
ඔබ රැස් කළ තොරතුරු සම්පූර්ණ කරන්න.

| පාසලක දක්නට ලැබෙන අනන්‍යතා ලක්ෂණ | මගේ පාසල | තෝරා ගත් පාසල |
|---|---|---|
| නිල ඇඳුමේ සුවිශේෂ ලක්ෂණ | | |
| නිල ලාංඡනයේ වර්ණ හා සංකේතවලින් ප්‍රකාශ වන දෑ | | |
| කොඩියේ වර්ණ, සංකේතවලින් පිළිබිඹු වන දේ | | |
| ආදර්ශ පාඨයේ අර්ථය | | |
| පාසල් ගීතයේ අර්ථය | | |

මගේ පාසල් ගීතය තුළින් කියවෙන දේ ඉටු කිරීමට ශිෂ්‍යයකු
වශයෙන් දායකත්වය ලබා දිය යුතු ආකාරය
.......................................................................................
.......................................................................................
.......................................................................................

# පියවර 2

## ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් අනුව පාසලේ සංස්කෘතිය පිළිබඳ පන්ති කාමර සංවාදයක යෙදෙන්න.
- එම සාකච්ඡාව පාසලේ සංස්කෘතියට අයත් මූලික අංග ඔස්සේ විමර්ශනය කරන්න.
    - පාසලේ පවතින නීති රීති (Rules and regulations of the school)
    - සම්ප්‍රදායයන් (Traditions)
    - අගයයන් (Values)
    - සිරිත් විරිත් (Customs)
    - පාසලේ පවතින පොදු නීති අනුගමනය කිරීමේ දී ශිෂ්‍ය වගකීම ඉටු කරන ආකාරය
- ඔබේ පාසලට අනන්‍ය වූ සිරිත් විරිත් අනුගමනය කරන අවස්ථා කණ්ඩායම් වශයෙන් පන්තිය ඉදිරියේ ආදර්ශනය (Demonstration) කර පෙන්වන්න.
- පාසලේ පවතින පොදු නීතිරීති අනුගමනය කිරීමේ දී ශිෂ්‍ය වගකීම ඉටු කරන ආකාරය කතාවක් ලෙස ඉදිරිපත් කිරීමට කරුණු ගොනු කර ගන්න.
- තම පාසලේ සහ තෝරා ගත් පාසලේ සංස්කෘතික අනන්‍යතාව ඉහත දැක්වෙන මූලික අංග ඔස්සේ සංසන්දනාත්මක ව හඳුනාගන්න.

ඔබ රැස් කළ තොරතුරු පහත සඳහන් වගුවේ ඇතුළත් ශීර්ෂ යටතේ සම්පූර්ණ කරන්න. අදාළ රූප සටහන් ඇත්නම් ඒවා ද භාවිත කරන්න.

| පාසල් සංස්කෘතියේ මූලික අංග | මගේ පාසල | තෝරා ගත් පාසල |
|---|---|---|
| නීති රීති | | |
| සම්ප්‍රදායයන්, අගයයන් හා සිරිත් විරිත් | | |

පාසලේ පවතින පොදු නීති රීති අනුගමනය කරමින් පාසලේ අභිවෘද්ධියට ශිෂ්‍යයකු වශයෙන් දායක විය හැකි ආකාරය පිළිබඳ මගේ කතාව

.......................................................................................................

.......................................................................................................


.......................................................................................................

.......................................................................................................



## තක්සේරු ක්‍රියාකාරකම

- ඉහත පියවර 1 හා 2 ඔස්සේ රැස් කළ තොරතුරු විද්‍යුත් සමර්පණයක් (Electronic Presentation) / නිර්මාණාත්මක ක්‍රමවේදයක් මගින් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඔබේ ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කර වැඩිදුර උපදෙස් ලබා ගන්න.
- ඔබ ඉදිරිපත් කරන නිර්මාණය පහත නිර්ණායක ඔස්සේ තක්සේරු කරනු ඇත.
    - පාසල් දෙකෙහි අනන්‍යතා ලක්ෂණ සංසන්දනාත්මක ව ගැලපීම
    - පාසල් දෙකෙහි මූලික සංස්කෘතිකාංග සංසන්දනාත්මක ව ගැලපීම
    - නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම
    - දත්ත හා තොරතුරුවල ප්‍රමාණාත්මක හා ගුණාත්මකබව
    - සාමූහික ව කටයුතු කිරීම





## සාරාංශය

- සෑම පාසලකට ම ආවේණික මෙන් ම සුවිශේෂ වූ අනන්‍යතා ලක්‍ෂණ හා ගුණාංග පවතී.
- පාසලක අනන්‍යතා ලක්‍ෂණ විදහාපාන අංග ලෙස,
    - නිල ඇඳුම
    - නිල ලාංඡනය
    - පාසල් කොඩිය
    - පාසල් ගීතය
    - පාසලේ ආදර්ශ පාඨය
    - දැක්ම හා මෙහෙවර

  ආදිය සලකනු ලැබේ.
- පාසලක් තවත් පාසලකින් වෙන් කර හඳුනාගැනීමට මෙම අනන්‍යතා ලක්ෂණ උපකාර වේ.
- පාසල් අනන්‍යතා සංකේත මගින් නිරූපණය වන හරය ඉටු කිරීමට දායක වීම ශිෂ්‍ය වගකීම හා යුතුකම වේ.
- පාසලේ සංස්කෘතික විවිධත්වයට අදාළ මූලික අංග වන්නේ,
    - පාසලේ පවතින නීති රීති
    - පාසලේ පවතින සම්ප්‍රදායයන්, සිරිත් විරිත්, අගයයන්. යනාදිය යි.
- තම පාසලේ සංස්කෘතියට මෙන් ම අන්‍ය පාසල්වල සංස්කෘතික අනන්‍යතාවට ගරු කිරීම සෑම ශිෂ්‍යයෙකුගේ ම යුතුකම හා වගකීම වේ.

## ස්වයං තක්සේරුව

| මා තහවුරු කර ගත් අත්දැකීම් |  |  |  |
|---|---|---|---|
| පාසලේ අනන්‍යතාව හඳුනාගැනීම සඳහා නිල ඇඳුම හා එහි ප්‍රමිතිය උපයෝගී වන ආකාරය | | | |
| පාසලේ අනන්‍යතාව හඳුනාගැනීමට නිල ලාංඡනය සහ පාසල් කොඩිය දායක වන ආකාරය | | | |
| පාසල් ගීතයෙන් නිරූපණය වන අර්ථය ඉටු කිරීමට තම දායකත්වය ලබා දිය යුතු ආකාරය | | | |
| ආදර්ශ පාඨයේ අර්ථය ක්‍රියාවේ යෙදවීම සඳහා ශිෂ්‍ය වගකීම් හා යුතුකම් | | | |
| පාසලේ පවතින සම්ප්‍රදායයන් හා සිරිත් විරිත් | | | |
| පාසලේ පවතින පොදු නීතිරීති | | | |
| පාසලේ පවතින පොදු නීතිරීති අනුමනය කිරීමේ ශිෂ්‍ය වගකීම් සහ යුතුකම් | | | |
| තම ආසන්න පාසල්වල සංස්කෘතික අනන්‍යතාව | | | |

 හොඳින් හඳුනාගතිමි.  තරමක් දුරට හඳුනාගතිමි.

 අවබෝධ කර ගැනීමට තවදුරටත් සහය අවශ්‍යයි.




# ක්‍රියාකාරකම 03
# පාසලේ සංවිධාන ව්‍යුහය හඳුනාගනිමු.

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා හට

- පාසලේ සංවිධාන ව්‍යුහය හඳුනාගැනීමට,
- පාසල් සංවිධාන ව්‍යුහයේ ප්‍රධාන භූමිකාවල කාර්ය සහ වගකීම් (Duties and Responsibilities) හඳුනාගැනීමට,
- ශිෂ්‍යයකු ලෙස පාසලේ අභිවෘද්ධිය සඳහා යුතුකම් හා වගකීම් ඉටු කිරීමට,
- පාසලේ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීම සඳහා ශිෂ්‍යයකු ලෙස දායක වීමට,

හැකියාව ලැබෙනු ඇත.

කාලය : කාලච්ඡේද 02යි




## පියවර 1

**එක්තරා පාසලක ගුරුභවතකු විසින් තම පාසලේ සංවිධාන ව්‍යුහය පිළිබඳ සිදු කරන ලද ප්‍රකාශයක් පහතින් දැක්වේ. එය හොඳින් කියවන්න.**

අප පාසලේ ප්‍රධානියා හා අධ්‍යාපන කටයුතුවල නියමුවා ලෙස විදුහල්පති කටයුතු කරන අතර, නියෝජ්‍ය විදුහල්පතිවරුන් දෙදෙනෙක් සහ සහකාර විදුහල්පතිවරු හතර දෙනෙක් සිටිනවා.

130ක් පමණ වන ගුරු මණ්ඩලයක් අප පාසලේ සේවය කරනවා. ඒ සියලු දෙනා ම පන්තිභාර සහ විෂයභාර ගුරුභවතුන් ලෙස පාසලට නොමඳ සේවයක් ලබා දෙනවා. අධ්‍යයන සහයක සේවක මහත්ම/මහත්මීන් 7 දෙනෙකු පාසලේ දෛනික කටයුතුවලට සහය ලබා දෙනවා. පාසල් සංවර්ධන කමිටුව, ආදි ශිෂ්‍ය සංගමය සහ ශිෂ්‍ය නායක මණ්ඩලය පාසලේ පරිපාලන, අධ්‍යයන හා වෙනත් කටයුතු සඳහා උපකාර කරනවා.



- **පාසල් සංවිධාන ව්‍යුහය පිළිබඳ ඉහත සිද්ධිය අධ්‍යයනය කරන්න. ඊට අදාල සංවිධාන ව්‍යුහය ගොඩනගන්න.**
- **ඔබ පාසලේ සංවිධාන ව්‍යුහය ගොඩනැගීමට අවශ්‍ය තොරතුරු රැස් කරන්න.**
- **ගුරුතුමා/ගුරුතුමියගේ සහය ලබා ගනිමින්, ඔබ පාසලට ගැළපෙන සංවිධාන ව්‍යුහය ගොඩනගන්න.**

### කියවමු

පාසලේ සංවිධාන ව්‍යුහය යනු පාසලේ පරිපාලන හා සංවර්ධන කටයුතුවල පහසුව සඳහා ඉහළ සිට පහළට තනතුරු සංවිධානය වී ඇති ආකාරය යි. පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව, සමාන්තර ශ්‍රේණි සංඛ්‍යාව, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය (Academic & Non - Academic Staff) අනුව මෙම සංවිධාන ව්‍යුහය වෙනස් විය හැකි ය. ඔබේ පාසලේ ද එවැනි සංවිධාන ව්‍යුහයක් පවතී. එම සංවිධාන ව්‍යුහය තුළ සිටින විවිධ භූමිකා තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීම පාසල ගුණාත්මකභාවය කරා ගෙන යාමටත්, පාසලේ සංවර්ධනයටත් මහෝපකාරී වේ.

## පියවර 2

### කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් අනුව සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදෙන්න.
- ඔබ කණ්ඩායමට ලැබුණු භූමිකාව අනුව එම භූමිකාව සතු කාර්යභාරය සහ වගකීම් පිළිබඳ හොඳින් අධ්‍යයනය කරන්න.
- ඒ සඳහා ඔබගේ ගුරුතුමා/ගුරුතුමියගෙන් උපදෙස් ලබා ගන්න.
- එම භූමිකාව සතු කාර්යභාරය සහ වගකීම් භූමිකා රංගනයක් මගින් (Role Play) පන්තියට ඉදිරිපත් කරන්න.



## පියවර 3

### තක්සේරු ක්‍රියාකාරකම

පාසලේ කීර්තිනාමය ආරක්ෂා කරගැනීමට පාසල් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලෙස කටයුතු කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ සහිත ව පහත කරුණු ඔස්සේ කණ්ඩායම් වශයෙන් කතන්දරයක් නිර්මාණය කරන්න.

- කතන්දරය සඳහා චරිත තුනක්වත් අවම වශයෙන් යොදා ගන්න.
- කතන්දරයේ චරිත සඳහා මනඃකල්පිත නම් යොදා ගන්න.
- කතාව ගොඩනැගීම සඳහා කණ්ඩායමේ සියලු සාමාජිකයන්ගේ සහය ලබාගන්න.
- එම කතන්දරය කණ්ඩායම් වශයෙන් සාමූහික ව පන්තියට ඉදිරිපත් කරන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් ලබා ගන්න.
- කණ්ඩායම් නිර්මාණය පහත නිර්ණායක ඔස්සේ තක්සේරු කරනු ඇත.
    - පාසලේ කීර්තිනාමය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාමාර්ග අන්තර්ගත වීම
    - ඉදිරිපත් කළ ක්‍රියාමාර්ගවල උචිතබව
    - නිර්මාණශීලීබව
    - ඉදිරිපත් කිරීමේ කුසලතා


## සාරාංශය

- පාසලක සංවිධාන ව්‍යුහය එහි සිටින ගුරුභවතුන් සහ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වෙනස් විය හැකි ය.
- පාසලක සංවිධාන ව්‍යුහය ඉහළ සිට පහළට තනතුරු අනුව වගකීම් ගලා යන ආකාරයෙන් ගොඩනැගී ඇත. සෑම තනතුරකට ම සුවිශේෂ වගකීම් හා කාර්යභාරයක් පවතී.
- සංවිධාන ව්‍යුහයක ඒ ඒ මට්ටම්වල නිලධාරීන්/ පුද්ගලයන් තම යුතුකම්, වගකීම් හා කාර්යභාරය ඉටු නොකිරීමෙන් ආයතනයේ අරමුණු කරා ළඟා වීමට නොහැකි වනු ඇත.
- පාසල් සංවිධාන ව්‍යුහයේ සාමාජිකයකු වශයෙන් සිසුන්ට ද සුවිශේෂ ස්ථානයක් හිමි ව ඇත.
- ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් පාසලේ අභිවෘද්ධිය සඳහා තම යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටු කිරීම අවශ්‍ය වේ.

## ස්වයං තක්සේරුව

| මා තහවුරු කර ගත් අත්දැකීම් |  |  |  |
|---|---|---|---|
| පාසලේ සංවිධාන ව්‍යුහය | | | |
| පාසලේ සංවිධාන ව්‍යුහයේ විවිධ භූමිකාවල කාර්ය සහ වගකීම් | | | |
| පාසලේ අභිවෘද්ධිය සඳහා ශිෂ්‍යයකු ලෙස යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව | | | |
| පාසලේ කීර්තිනාමය ආරක්ෂා කරගැනීමට ශිෂ්‍යයකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම | | | |

 හොඳින් හඳුනාගතිමි.  තරමක් දුරට හඳුනාගතිමි.

 අවබෝධ කර ගැනීමට තවදුරටත් සහය අවශ්‍යයි.

## ක්‍රියාකාරකම 04
## ප්‍රජාව සමග එක් වී පාසල ගොඩනගමු.

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා හට

- පාසලේ පැවැත්මට සහය වන අභ්‍යන්තර සහ බාහිර ප්‍රජාව (Internal and External Community) හඳුනාගැනීමට,
- පාසල් ප්‍රජාව දායකත්වය ලබා දෙන ක්‍රියාකාරකම්වලට ශිෂ්‍යයකු ලෙස සහය වීමට,
- ආදි ශිෂ්‍යයකු ලෙස අනාගතයේ දී පාසලේ සංවර්ධනයට දායක විය හැකි ආකාර හඳුනාගැනීමට,

හැකියාව ලැබෙනු ඇත.

කාලය : කාලච්ඡේද 02යි.

### කියවමු

පාසලේ අභිවෘද්ධිය උදෙසා පාසල හා ප්‍රජාව අතර පවතින විවිධ, යහපත් සබඳතා ඉතා වැදගත් වේ. පාසල් ප්‍රජාව අභ්‍යන්තර හා බාහිර ප්‍රජාව ලෙස කොටස් දෙකකි. පාසලේ සංවිධාන ව්‍යුහය තුළ සාකච්ඡා කෙරෙන විදුහල්පති, ආචාර්ය මණ්ඩලය, සහයක කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් යන භූමිකාවලින් අභ්‍යන්තර ප්‍රජාව නිරූපණය වේ. ඒ පිළිබඳ ව පෙර ක්‍රියාකාරකමක දී ඔබට හඳුනාගැනීමට අවස්ථාව ලැබුණි. පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍ය සමිති, ආගමික ආයතන, සුබපතන්නන්, මහජන නියෝජිතයන්, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන බාහිර ප්‍රජාව යන අංශයට අයත් වේ.

## පියවර 1

ඔබේ පාසලේ බාහිර ප්‍රජාව ලෙස ඔබ හඳුනාගත් විවිධ පුද්ගල කණ්ඩායම් හා සංවිධාන පහත ආකෘතිය අනුව අභ්‍යාස පොතේ සටහන් කරන්න.





ඔබේ පාසලේ බාහිර ප්‍රජාව පාසලේ පැවැත්ම අභිවෘද්ධිය වෙනුවෙන් දායක වන ආකාර සම්බන්ධ ඡායාරූප රැස්කර ගන්න.

## පියවර 2

**පොදු උපදෙස්**

- ඔබ රැස් කළ ඡායාරූප හා තොරතුරු පදනම් කරගෙන ගුරුතුමා/ ගුරුතුමියගේ සහය ඇති ව පහත කරුණු ඔස්සේ සාකච්ඡාවක නිරතවන්න.
  - ප්‍රජාව විසින් පාසලේ පැවැත්ම හා අභිවෘද්ධිය වෙනුවෙන් දායක වන ආකාරය
  - පාසල විසින් ප්‍රජාවේ පැවැත්ම හා සංවර්ධනය වෙනුවෙන් දායක වන ආකාරය
  - පාසලේ ආදි ශිෂ්‍යයකු ලෙස අනාගතයේ දී පාසලේ සංවර්ධනයට තමන්ට දායක විය හැකි ආකාරය

**එම සාකච්ඡාව පදනම් කරගෙන පහත ආකෘතිය සම්පූර්ණ කරන්න.**






## තක්සේරු ක්‍රියාකාරකම

- අනාගතයේ දී ඔබ, ආදි ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක ලෙස පාසලේ සංවර්ධනයට සාමූහික ව දායක විය හැකි ආකාරය පිළිබඳ ව පන්තිය ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත කතාවක දළ සටහනක් පිළියෙළ කරන්න.
- පහත නිර්ණායක ඔස්සේ ඔබ ව තක්සේරු කරනු ඇත.
  - අදහස්වල ඵලදායිබව
  - ප්‍රායෝගිකබව
  - භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා අදාළ වීම
  - පාසලේ අනන්‍යතාව ආරක්ෂා වීම
  - සාමූහික ව ඉටු කර ගැනීමට හැකි වීම

# සාරාංශය

- පාසලක පැවැත්ම හා අභිවෘද්ධිය සඳහා එහි අභ්‍යන්තර හා බාහිර ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය අත්‍යවශ්‍ය වේ.
- පාසලක බාහිර ප්‍රජාව
    - ආදි ශිෂ්‍යයන්
    - දෙමව්පියන්
    - සුබ පතන්නන්
    - විවිධ රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන
    - මහජන නියෝජිතයන්
    - ප්‍රදේශවාසීන්

  වැනි විවිධ පාර්ශවවලින් සමන්විත වේ.
- ප්‍රජාව පාසලේ පැවැත්ම හා අභිවෘද්ධිය වෙනුවෙන් දායක වන අතර පාසල ද ප්‍රජාවේ පැවැත්ම හා සංවර්ධනය වෙනුවෙන් දායක වේ.
- ආදි ශිෂ්‍යයකු ලෙස අනාගතයේ දී ද පාසලේ සංවර්ධනයට දායක වීම තම යුතුකම හා වගකීම ලෙස වටහා ගෙන ක්‍රියා කළ යුතු ය.

ස්වයං තක්සේරුව

| මා තහවුරු කර ගත් අත්දැකීම් | | | |
|---|---|---|---|
| පාසලේ පැවැත්මට සහය වන අභ්‍යන්තර සහ බාහිර ප්‍රජාව | | | |
| පාසල් ප්‍රජාව දායකත්වය ලබා දෙන ක්‍රියාකාරකම් හඳුනාගෙන ශිෂ්‍යයකු ලෙස ඊට සහයවීම | | | |
| ආදි ශිෂ්‍යයකු ලෙස අනාගතයේ දී පාසලේ සංවර්ධනයට දායක විය හැකි ආකාර | | | |

හොඳින් හඳුනාගතිමි. තරමක් දුරට හඳුනාගතිමි.

අවබෝධ කර ගැනීමට තවදුරටත් සහය අවශ්‍යයි.

# ක්‍රියාකාරකම 05 - අනාගත පාසලේ ස්වභාවය මනසින් ගොඩනගමු. (Imagination)

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා හට**

- අනාගත පාසලේ ස්වභාවය හඳුනාගැනීමට,
- අනාගත පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනසින් ගොඩනැගීමට,
- තම පාසල පිළිබඳ අනාගත දැක්ම (Future Vision) හඳුනාගැනීමට,

හැකියාව ලැබෙනු ඇත.

කාලය : කාලච්ඡේද 02 යි.



# පියවර 1

## කියවමු

"හරිත පාසල" යනු තිරසර සංවර්ධනය උදෙසා පාසල් වියේ සිට ම සිසුන් තුළ පරිසර හිතකාමී දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රගුණ කිරීමට මෙන් ම ඒවා අඛණ්ඩ ව සංවර්ධනය කිරීමට ක්‍රියාත්මක වන ක්‍රමය වේ.



හරිත පාසල
(Green school)



අතත්‍ය පාසල
(Virtual school)




"අතත්‍ය පාසල" යනු සයිබර් අවකාශය (Cyber Space) භාවිතයට ගනිමින් සිසුන් හා ගුරුවරුන් යන දෙපාර්ශවය ම මුහුණට මුහුණ හමු නොවී (Distance), මාර්ගගත ව (Online) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවීම මෙන් ම ජාත්‍යන්තර වශයෙන් දැනුම් නිර්මාණය සහ හුවමාරුව ක්‍රියාත්මක වන ක්‍රමය වේ.

## පියවර 2

### පොදු උපදෙස්

- හරිත පාසල් සංකල්පය හා අනන්‍ය පාසල් සංකල්පය පිළිබඳ ව ඉහත පිටුවේ සඳහන් සටහන් ඇසුරු කර ගෙන ගුරුතුමා/ගුරුතුමියගේ සහය ඇති ව පන්ති කාමර සංවාදයක නිරතවන්න.
- සාකච්ඡාව පදනම් කරගනිමින් තම පාසල ද ඇතුළු ව අනාගතයේ දී පාසල්වල ස්වභාවය, ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය වෙනස් විය හැකි ආකාරය මනසින් ගොඩනගන්න.
- මනසින් ගොඩනැගූ දෑ තම සගයා සමග ද, ඉන් පසු සමස්ත කණ්ඩායම සමග ද හුවමාරු කර ගන්න. (Think - Pair - Share)


### තක්සේරු ක්‍රියාකාරකම

- පියවර 02 දී සාකච්ඡා කරන ලද කරුණු පදනම් කර ගනිමින් අනාගතයේ දී මගේ පාසලේ භෞතික සහ මානව සම්පත්වල වෙනස්වීම් මනසින් ගොඩනගා ගෙන "මා දකින අනාගත පාසල" මැයෙන් නිර්මාණයක් සකස් කරන්න.
- ප්‍රදර්ශන කුටි ක්‍රමය (Gallery walk) භාවිතයෙන් නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.
- පහත නිර්ණායක ඔස්සේ ඔබේ නිර්මාණය තක්සේරු කරනු ඇත.
    - සංකල්පය නිවැරදි ව වටහා ගැනීම
    - සිතා ගැනීම් ප්‍රායෝගිකත්වයෙන් යුක්ත වීම
    - නිර්මාණශීලීබව
    - ඉදිරිපත් කිරීමේ කුසලතා

## සාරාංශය

- තිරසර සංවර්ධනය උදෙසා පාසල් වියේ සිට ම සිසුන් තුළ පරිසර හිතකාමී දැනුම, ආකල්ප හා පුරුදු ප්‍රගුණ කිරීමටත්, අඛණ්ඩ ව සංවර්ධනය කිරීමටත් පාසල් පරිසරය සැකසීම "හරිත පාසල" සතු වගකීමකි.
- සයිබර් අවකාශය (Cyber Space) භාවිතයට ගනිමින් සිසුන් හා ගුරුවරුන් යන දෙපාර්ශවය ම මුහුණට මුහුණ හමු නොවී (Distance), මාර්ගගත ව (Online) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවීම මෙන් ම ජාත්‍යන්තර වශයෙන් දැනුම් නිර්මාණය සහ හුවමාරුව ක්‍රියාත්මක වීම අතත්‍ය පාසලේ සුවිශේෂත්වය වේ.
- හරිත පාසල සහ අතත්‍ය පාසල යන සංකල්ප වර්තමානයට මෙන් ම අනාගතයට ද යෝග්‍ය වේ.
- හරිත පාසල ගොඩනැගීම උදෙසා ශිෂ්‍යයාට පන්ති කාමර සහ පාසල් මට්ටමින් හරිත සමාජ (Green Society) පිහිටුවීම වැනි ක්‍රියාකාරකම් ඔස්සේ දායක විය හැකි ය.
- තිරසර සංවර්ධනය (Sustainable Development) උදෙසා හරිත පාසල් සංකල්පය දායක වන අතර, වර්තමාන සමාජ වෙනස්වීම් හමුවේ භෞතික පාසල් පරිසරයෙන් ඔබ්බට පාසලේ ක්‍රියාකාරිත්වය ව්‍යාප්ත වනු ඇත.
- අතත්‍ය පාසල වැනි සංකල්ප බිහි වීම හේතු කොට ගෙන වර්තමාන පාසල විශ්වීය අවකාශය ජය ගැනීමට යොමුව ඇති බැවින් පාසල තුළ ගුරු සිසු භූමිකා ධනාත්මක ලෙස වෙනස් විය යුතු ය.

## ස්වයං තක්සේරුව

| මා තහවුරු කර ගත් අත්දැකීම් |  |  |  |
|---|---|---|---|
| අනාගතයේ දී පාසලේ ස්වභාවය | | | |
| හරිත පාසල් සංකල්පය හා අතථ්‍ය පාසල් සංකල්පය | | | |
| අතථ්‍ය පාසල් සංකල්පයේ සුවිශේෂ ලක්ෂණ | | | |
| අනාගතයේ දී පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනසින් ගොඩනැගීම | | | |
| තම පාසල පිළිබඳ අනාගත දැක්ම | | | |

 හොඳින් හඳුනාගතිමි.  තරමක් දුරට හඳුනාගතිමි.

 අවබෝධ කර ගැනීමට තවදුරටත් සහය අවශ්‍යයි.

# ක්‍රියාකාරකම 06 - මම මගේ ස්වභාවය හඳුනාගනිමි.

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා හට**

- තම හැකියා සහ ළැදියා (Abilities and Interests) හඳුනාගැනීමට,
- තම දක්ෂතා ඔස්සේ අනාගත ඉලක්ක (Future Targets) සපුරා ගැනීමට,
- ශිෂ්‍යයකු වශයෙන් කටයුතු කිරීමේ දී තමාට පවතින බාධා හා තර්ජන (Obstacles & threats) හඳුනාගැනීමට,
- තමාට පවතින බාධා හා තර්ජන සාර්ථක ව ජය ගැනීම සඳහා ඇති විකල්ප ක්‍රම (Alternatives) තෝරාගැනීමට,

හැකියාව ලැබෙනු ඇත.

**කාලය : කාලච්ඡේද 01යි.**



## පියවර 1

### පොදු උපදෙස්

- ගුරුතුමා/ගුරුතුමිය ඔබ හමුවේ ඉදිරිපත් කරන කතන්දරයට හොඳින් සවන් දෙන්න.
- එම කතන්දරයෙන් නිරූපණය වන චරිතයට අදාළ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන ගුරුතුමා/ ගුරුතුමියගේ මගපෙන්වීම යටතේ හඳුනාගන්න.
- පහත ආකෘතිය යොදා ගනිමින් ඔබ සතු සුවිශේෂ ශක්තීන්, දුර්වලතා, මෙන් ම ඔබට පවතින අවස්ථා සහ තර්ජන හඳුනාගෙන සටහන් කරන්න.

**මා සතු සුවිශේෂ ශක්තීන්, දුර්වලතා, මට පවතින අවස්ථා සහ තර්ජන**

| මා සතු ශක්තීන් (Strengths) | මගේ දුර්වලතා (Weaknesses) |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

| මා හට පවතින අවස්ථා (Opportunities) | මා හට පවතින තර්ජන (Threats) |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |




## තක්සේරු ක්‍රියාකාරකම


- ඉහත සඳහන් කළ ඔබ සතු සුවිශේෂ ශක්තීන්, දුර්වලතා, පවතින අවස්ථා සහ තර්ජන ඇතුළත් වන සේ ආකෘතිය 01 ඇසුරින් සංකල්ප සිතියමක් (Concept Map) නිර්මාණය කරන්න.
- ඔබ ගොඩ නගා ගත් සංකල්ප සිතියම පහත සඳහන් අංශ යටතේ කරුණු ඇතුළත් කරමින් ආකෘතිය 02 නිර්මාණය කරන්න.
    - ශක්තීන් වර්ධනය කර ගත හැකි ආකාර
    - දුර්වලතා අවම කර ගත හැකි ආකාර
    - පවතින බාධා හා තර්ජන සාර්ථක ව ජය ගැනීමට ක්‍රියා කළ යුතු ආකාර
    - තමාට ඇති අවස්ථා ප්‍රයෝජනයට ගත හැකි ආකාර
- ඔබ විසින් නිර්මාණය කරන ලද සංකල්ප සිතියම පහත නිර්ණායක යටතේ තක්සේරුවට ලක් කරනු ඇත.
    - ශක්තීන් හඳුනාගැනීම හා ඒවායේ පැහැදිලිබව
    - දුර්වලතා හඳුනාගැනීම, ඒවායේ පැහැදිලිබව සහ යෝජනා ඉදිරිපත්කර තිබීම
    - අවස්ථා පැහැදිලි ව හඳුනාගැනීම හා ප්‍රමුඛතාගත කිරීම
    - තර්ජන පැහැදිලි ව හඳුනාගැනීම හා ඒවා ජය ගැනීමට යෝජනා ඉදිරිපත්කර තිබීම
    - නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම



ආකෘතිය 01





ආකෘතිය 02




## සාරාංශය

- පුද්ගලයන් තුළ විවිධ ශක්තීන් මෙන් ම, විවිධ දුර්වලතා/අඩුපාඩු ද පවතී.
- එම දුර්වලතා අවම කර ගැනීමට/නැති කර ගැනීමට නිරන්තරයෙන් උත්සාහ දැරිය යුතු ය.
- දුර්වලතා අවම කර ගැනීමට කටයුතු කිරීමේ දී විවිධ අභියෝග, තර්ජනවලට මුහුණදීමට සිදු වේ.
- තම හැකියා, ළැදියා, දක්ෂතා ඔස්සේ අනාගත ඉලක්ක සපුරා ගැනීමට පාසල තුළ ඇති අවස්ථා ඵලදායී ව යොදා ගැනීමට උත්සාහ කළ යුතු ය.
- තම දියුණුව ඇති කරගැනීම තමා සතු වගකීමක් වන බැවින් ඒ සඳහා කැප වී ක්‍රියාත්මකවීම අත්‍යවශ්‍ය වේ.
- තමා පිළිබඳ ව තමා විසින් ම හොඳින් විශ්ලේෂණය කිරීමේ හැකියාව තම සංවර්ධනයේ පදනම වේ. ඒ සඳහා තම මිතුරු/මිතුරියන්ගේ සංවර්ධනාත්මක යෝජනා ඉවහල් කර ගත හැකි ය.
- සෙසු සගයන්ගේ අභිවෘද්ධිය සඳහා අදහස්/යෝජනා ඉදිරිපත් කිරීමෙන් තමාට ද සමාජ වගකීමක් ඉටු කළ හැකි ය.

## ස්වයං තක්සේරුව

| මා තහවුරු කර ගත් අත්දැකීම් |  |  |  |
|---|---|---|---|
| ස්වයං විශ්ලේෂණයක් ඇසුරින් මා සතු හැකියා, ළැදියා සහ දක්ෂතා | | | |
| ශිෂ්‍යයකු වශයෙන් මා හට පවතින බාධා හා තර්ජන | | | |
| මා සතු දක්ෂතා ඔස්සේ අනාගත ඉලක්ක සපුරා ගැනීමට පාසල තුළ ඇති අවස්ථා | | | |
| මා හට පවතින බාධා හා තර්ජන සාර්ථක ව ජය ගැනීමට යොදාගත හැකි වෙනත් අවස්ථා | | | |

 හොඳින් හඳුනාගතිමි.  තරමක් දුරට හඳුනාගතිමි.

 අවබෝධ කර ගැනීමට තවදුරටත් සහය අවශ්‍යයි.